	(2020 වර්ෂයේ කරන ලද පූර්ව ගෙවීම් සටහන් කිරීම සහ මෙය පරිගණක උපකරණවල නඩත්තු ගිවිසුම් සඳහා මෙම ගෙවීම සිදුකරන ලදී. 2021 කාලසීමාව සඳහා අදාළ මුදල 20202 මූල්‍ය ප්‍රකාශනවල පූර්ව ගෙවීම් ලෙස සටහන් කරනු ලැබේ.)		

JE NO 15	ස්ථාවර තැන්පත් පොලී ආදායම ගිණුම (හර)	85,655.36	
	ස්ථාවර තැන්පත් පොලී ආදායම ගිණුම		85,655.36
	(අතිරික්තව හඳුනාගන්නා ලද ස්ථාවර තැන්පත් ආදායම නිවැරදි කරමින් පවතින අතර 2019 මූල්‍ය ප්‍රකාශනයෙහි ලැබියයුතු ස්ථාවර තැන්පත් පොලි මුදල)		
JE NO 16	පූර්වගෙවීම්	21,365.00	
	කාර්යාලය අලුත්වැඩියාකිරීම සහ නඩත්තුව		21,365.00
	(2020 වර්ෂයේ කාර්යාල උපකරණ වල නඩත්තු ගිවිසුම් සඳහා ගෙවීම් වැරදි ලෙස 2019 වර්ෂයේ වියදම් ලෙස සටහන් කර තිබේ. 2020 වර්ෂයේ වියදම් නැවත ගණනය කිරීමෙන් එය නිවැරදි කෙරේ.)		
JE NO 17	භාණ්ඩාගාර බිල්පත් ගිණුම (හර)	2,027,925.00	
	භාණ්ඩාගාර බිල්පත් පොලී ගිණුම		2,027,925.00
	(2019 ගිණුම් වල සම්මත වූ J/E අංක 23 වැරදි වන අතර එම දෝෂය හේතුවෙන් ලැබුණු පොලී ආදායම සහ භාණ්ඩාගාර බිල්පත් ශේෂය 2,027,925 ක් අඩු අගයකින් සඳහන් වේ. මෙම ජර්නල් සටහන සම්මත කිරීමෙන් දී එය නිවැරදි කරනු ලැබේ.		
JE NO 18	භාණ්ඩාගාර බිල්පත් ගිණුම (හර)	35,984.04	
	අරමුදල් ගිණුම - 2019 වර්ෂයේ අතිරික්ත වැඩි වියදම		35,984.04
	(2019 ගිණුම් වල සම්මත වූ නිවැරදි J/E අංක 22 හි නිවැරදි කරන ලද මුදල 3,915,381 කි. වැරදි මුදල හේතුවෙන් භාණ්ඩාගාර බිල රුපියල් 36,000 ක් අඩුවෙන් ප්‍රකාශයට පත් කර තිබෙන අතර මෙම ජර්නල් සටහන සම්මත කිරීමෙන් එය නිවැරදි කෙරේ)		
JE NO 19	රක්ෂණ සමාගම් වලින් දායකත්වය (හර)	6.00	
	රක්ෂණ සමාගම් වලින් ලැබියයුතු		6.00
	(2019.12.31 දිනට ලැබිය යුතු රක්ෂණ ආදායම රුපියල් 7 කින් පමණ ඉක්මවා ඇති අතර මෙම ජර්නල් සටහන සම්මත කිරීමෙන් එය නිවැරදි කරනු ලැබේ.)		

මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව

2020 දෙසැම්බර් 31 දිනට ශේෂ පිරික්සුම. (ජර්නල් සටහන් සම්මතවීමට පෙර)

	හර	බැර
වත්කම්		
	713,500.00	
ඡායා පිටපත්, මුද්‍රණ යන්ත්‍ර, ෆැක්ස් යන්ත්‍ර	140,700.00	
ගෘහභාණ්ඩ සහ මෙවලම්	641,500.00	
වායුසමීකරණ	139,800.00	
DVD ප්ලේයර් ආදිය	1,554,862.50	
වෙනත් වත්කම්	62,207.50	
කැමරා	-	
රියදුරු ඉගැනුම් යන්ත්‍ර	5,875,351.00	
ශීතකරණය	133,000.00	
සමුච්ඡින ක්ෂය		
පරිගණක		328,786.50
ඡායා පිටපත්, මුද්‍රණ යන්ත්‍ර, ෆැක්ස් යන්ත්‍ර		32,976.56
ගෘහභාණ්ඩ සහ මෙවලම්		230,940.00
වායුසමීකරණ		32,765.63
ඩී.වී.ඩී ප්ලේයර් ආදිය		258,236.71
වෙනත්		20,292.81
කැමරා		
රියදුරු ඉගැනුම් යන්ත්‍ර		619,728.80
ශීතකරණය		9,656.16
ස්ථාවර තැන්පත්	135,606,733.27	
භාණ්ඩාගාර බිල්පත්	250,234,059.36	
රක්ෂණ සමාගම් වලින් ලැබියයුතු	3,661,311.68	
අරමුදල් ගිණුම		419,555,824.89
රක්ෂණ සමාගමෙන් දායකත්වය		43,642,940.75
ස්ථාවර තැන්පත් පොළී ගිණුම		949,800.54
ස්ථාවර තැන්පත් පොළී ලැබියයුතු ගිණුම	1,884,353.38	
භාණ්ඩාගාර බිල්පත් පොළී ගිණුම		-
භාණ්ඩාගාර බිල්පත් පොළි ලැබියයුතු ගිණුම	1,938,329.90	
ගෙවියයුතු විගණන ගාස්තු		375,000.00
වාහන සඳහා ඉන්ධන	87,500.00	
සභා උපදේශක දීමනා	1,924,735.88	
සභා සාමාජික දීමනා	201,500.00	
වන්දි	4,275,000.00	
අලුත්වැඩියා සහ නඩත්තු	319,122.44	
වාහන නඩත්තු	13,717.01	
ක්ෂය		
ලිපිදුව්‍ය වියදම්	159,280.00	
දූරකථන ගාස්තු	171,069.72	
ප්‍රවත්පත්	83,790.00	
මුද්‍රණය සහ පරිවර්තනය	59,437.50	
අතිකාල ගාස්තු	124,779.88	
දැන්වීම්කරණය සහ ප්‍රචාරණය	-	
රැස්වීම් සඳහා සංග්‍රහ	78,607.67	
ගමන් වියදම්	31,535.00	
විවිධ වියදම්	62,588.69	
බැංකු ශේෂය	55,221,484.39	
නවාතැන්	-	
තැපැල් ගාස්තු	3,720.00	
කාර්ය මණ්ඩල පුහුණුව	-	
ව්‍යාපෘති (ව්‍යවසාය ශ්‍රී ලංකා)	-	
ආදායම් බදු	-	
විගණන ගාස්තු	-	
දැනට පවතින රැඳවුම් බද්ද සහ වෙනත්		-
පිරිසිදුකිරීමේ ගාස්තු	653,372.58	
ගෙවියයුතු අඩුකිරීම	-	
	466,056,949.35	**466,056,949.35**

විගණකාධිපති වාර්තාව -2020

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. } සීවීපී/සි/එන්.සි.ආර්.එස්/එෆ්.ඒ/2020 මබේ අංකය உமது இல. Your No. } දිනය திகதி Date } 2021 ජූලි 12 දින

සභාපති,

මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව.

මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය, සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධි විධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ 2020දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ජංගම නොවන වත්කම් යටතේ මූල්‍ය ප්‍රකාශනයන්හි දක්වා තිබුණු ස්ථාවර තැන්පතු වටිනාකම රු. 1,124,276 ක් අඩුවෙන් පෙන්නුම් කර තිබුණි.

(ආ) අංක 1368/18 හා 2004 නොවැම්බර් 24 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය ප්‍රකාරව සභාව වෙත රක්ෂණ ආයතන විසින් ප්‍රේෂණය කර තිබුණු රු.43,768,526ක් වූ සියයට 01 හි තෙවන පාර්ශවීය රක්ෂණ දායකත්වය පිළිබඳ නිවැරදිතාවය තහවුරු වන රක්ෂණ ආයතන විසින් ඉදිරිපත් කරන උපලේඛන විගණනයට ඉදිරිපත් නොවීය.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 සභාවේ වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත්තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබාදීමට බලාපොරොත්තු සභාවේ වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

සභාවේ 2020 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තවදුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සභාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එනි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රදා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙසමා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයාගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරුකිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණනපරිපාටි සැලැසුම්කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණ විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව්කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම් යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ

සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇතිබව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2 වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා සභාව පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (III) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ6 (i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමාකිරීම් තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සභාවේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට සභාව හා සම්බන්ධ වී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණය හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීතිරීති / විධානයට යොමුව	විස්තරය
(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය	
(i) සංග්‍රහය මුදල් රෙගුලාසි 110	හානි පිළිබඳ ලේඛණයක් පවතවාගෙන ගොස් නොතිබුණි
(ii) මුදල් රෙගුලාසි 891 (1)	වත්කම් භාරව කටයුතු කරන නිලධාරීන් විසින් ඇප තැබිය යුතු නිලධාරීන් හා සේවකයන්ගේ තොරතුරු ඇතුලත් ඇප ලේඛණයක් පවත්වාගෙන ගොස් නොතිබුණි.
(ආ) 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍ර ලේඛය සහ මුදල් රෙගුලාසි 502 (2) 11 වන පරිශිෂ්ඨය	ආයතනය සතු ස්ථාවර වත්කම් සටහන් කිරීම සඳහා ස්ථාවර වත්කම් ලේඛණයක් පවත්වාගත යුතු වුවද, ඒ අනුව කටයුතු කර නොතිබුණි.
(ඇ) 1971 අංක 38 දරන මුදල් පනතේ 11 වන වගන්තිය සහ අංක PED/12 සහ 2003 ජූනි 02 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 5.2.4 වගන්තිය	මුදල් වර්ෂය ආරම්භවීමට මාස 03 කට පෙර සභාව විසින් අයවැය ලේඛණය අනුමත කළ යුතු වුවද සමාලෝචිත වර්ෂයේ අයවැය ඇස්තමේන්තුව සඳහා අනුමැතිය ලබාගෙන තිබුණේ 2020 පෙබරවාරි 28 දිනදීය.
(ඈ) 2003 ජූනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ	
(i) 4.2.2 ඡේදය	පාලක මණ්ඩල රැස්වීම් මාසිකව පැවත්විය යුතු වුවද, සමාලෝචිත වර්ෂයට අදාළව රැස්වීම් 02 ක් පමණක් පවත්වා තිබූ අතර පවත්වා තිබූ රැස්වීම් සඳහාද සියළුම සාමාජිකයින් නියෝජනය වීමක් සිදු වී නොතිබුණි.

(ii) 8.8 ඡේදය — මූල්‍ය බලතල පැවරීම වර්ෂය ආරම්භයේදීම සභාව මගින් අනුමත කරවාගත යුතු වුවද, එය අනුමත කර තිබුණේ 2020 පෙබරවාරි 28 දින පැවති සභා රැස්වීමේදීය.

2.2.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර සභාවේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

(අ) 1998 අංක 05 දරණ මෝටර් වාහන පනතින් සංශෝධිත පනතේ (203 වන අධිකාරිය) මගින් මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික කොමිෂම ස්ථාපනය කිරීම අරමුණු කොටගෙන ජාතික සභාව පිහිටුවා වසර 15 ක් ගත වී ඇතත් කොමිෂමක් ලෙස ස්ථාපිත නොවීම හේතුවෙන් මෙම සභාවේ කාර්යයන් ඉටුකිරීමට නීතිමය බලතල ලැබී නොතිබුණු අතර විධිමත් කාර්ය මණ්ඩලයක් පත්කර ගැනීමට එය බාධාවක්ව තිබුණි.

(ආ) අංක 1387/4 හා 2005 අප්‍රේල් 04 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මගින් පවරා තිබූ කාර්යයවලින් රථ වාහන ප්‍රමාණය ඒවායේ ලක්ෂණ හා සංයුතිය, මාර්ග අනතුරු හා මාර්ග ආරක්ෂාව පිළිබඳ දේශීය හා ජාත්‍යන්තර සංඛ්‍යා තොරතුරු ඇතුලත් පරිගණක දත්ත ගබඩාවක් පවත්වාගෙන යාම, මාර්ග ආරක්ෂාව විෂය පිළිබඳ පුස්තකාලයක් පවත්වාගෙන යාම සම්බන්ධිත විෂයයන් පිළිබඳ පර්යේෂණවලට ආධාර කිරීම, සමාන ජාත්‍යන්තර ආයතන සමඟ සබඳතා පැවත්වීම දැනුම හුවමාරු කර ගැනීම,මාර්ග ආරක්ෂාව පිළිබඳ ව්‍යාපෘති සකස් කිරීම හා ක්‍රියාවට නැංවීම, රජය හා රාජ්‍ය නොවන සංවිධාන තුල මාර්ග ආරක්ෂාව සම්බන්ධිත කාර්යයන් සම්බන්ධීකරණය කිරීම සහ මාර්ග ආරක්ෂාව හා සම්බන්ධිත ප්‍රතිපත්තීන් සහ ව්‍යාපෘති පිළිබඳ රජයට උපදෙස් ලබාදීම යන කාර්යයන් ඉටුකර ගැනීමට සමාලෝචිත වර්ෂය වන විටත් කටයුතු කර නොතිබුණි.

2.2.4 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සභාවේ සම්පත් සැකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

03. වෙනත් කරුණු

(අ) හදුනා නොගත් මෝටර් රථවලින් අනතුරට ලක් වූ පුද්ගලයන් සඳහා වන්දි ගෙවීම් යෝජනා ක්‍රමයේ උපදෙස් පත්‍රිකාව අනුව වන්දි ඉල්ලීම සඳහා ඉදිරිපත් වී තිබූ අයදුම්කරුවන්ට ප්‍රමාදයකින් තොරව වන්දි ලබාදිය යුතු වුවද, මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවට 2018 වර්ෂයේ සිට 2019 දෙසැම්බර් දක්වා කාලය තුල ලැබී තිබුණු වන්දි අයදුම්පත් 06 ක් ඉදිරිපත් කළ දින සිට වර්ෂ 01 සිට වර්ෂ 02 කුත් මාස 06 ක් ගත වී ඇතත් විගණිත දින වන විටත් එම වන්දි ගෙවීමට සභාව කටයුතු කර නොතිබුණි.

(ආ) 2018 සහ 2019 වර්ෂවල හදුනා නොගත් වාහනවලින් සිදු වී තිබූ මරණ 02 ක් සඳහා ලැබී තිබූ අයදුම්පත් වෙනුවෙන් අවශ්‍ය පියවර ගැනීමට ප්‍රමාදවීම හේතුවෙන් වර්ෂ 01 ත් මාස 07 ක සහ වර්ෂ 02 කුත් මාස 06 ක ප්‍රමාදයකින් යුතුව රු. 400,000 ක වන්දි මුදල් ගෙවා තිබුණු අතර 2015, 2017 සහ 2019 වර්ෂවලදී තුවාලකරුවන් වෙනුවෙන් ලැබී තිබූ අයදුම්පත්‍ර 08 ක් සඳහා රු.775,000 ක වන්දි මුදලක් සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණද, අයදුම්පත් ලැබී අවුරුදු 01 මාස 02 ක් සහ අවුරුදු 05 ක් අතර ප්‍රමාදයකින් පසුව වන්දි මුදල් ගෙවා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී රක්ෂණ ආයතනවලින් රු. 43,768,526 ක දායක මුදල් ලැබී තිබුණද, ඉන් වන්දි වශයෙන් ගෙවා රු.4,275,000 ක් පමණි. එම මුදල දායක මුදල් ලැබීම්වලින් සියයට 10 ක ප්‍රතිශතයක් විය. ශ්‍රී ලංකාව තුල සිදුවන වාහන අනතුරු සම්බන්ධයෙන් සලකා බැලීමේදී වන්දි මුදල් ලබාගැනීම සම්බන්ධව මහජනතාවගේ නොදැනුවත්භාවය මෙම තත්ත්වයට ප්‍රධාන වශයෙන් හේතු වී ඇති බව නිරීක්ෂණය වේ.

(ඈ) මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව ශක්තිමත් කිරීම සඳහා ප්‍රමාණවත් පුහුණු කාර්ය මණ්ඩලයක් හා අවශ්‍ය යටිතල පහසුකම් සපුරාගත යුතු වුවද, ප්‍රවාහන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ආයතනයක් ලෙස කටයුතු කරන අතර මෙම සභාව ප්‍රවාහන අමාත්‍යාංශය, ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව හා ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට අනුයුක්ත නිලධාරීන් 11 ක ගෙන් හා කොන්ත්‍රාත් පදනම මත සේවය ලබාගත් නිලධාරියෙකුගෙන් හා අනියම් කම්කරුවකුගෙන් සමන්විත විය.

(ඉ) 2018 දෙසැම්බර් මස ජපන් පරිත්‍යාග ලෙස ලැබී තිබූ හා මිළදී ගෙන තිබූ රු. 5,875,351 ක් වටිනා රියදුරු පුහුණු උපකරණවලින් රියදුරු පුහුණු කිරීම් සාර්ථකව සිදුකර නොතිබූ අතර 2019 ජූනි 21 දිනෙන් පසු 2021 මාර්තු දක්වා පුහුණු කටයුතු නවතා දමා තිබීම හේතුවෙන් එම උපකරණ නිශ්කාර්යව පැවතුණි.

(ඊ) 2014 පෙබරවාරි 17 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2014 (4)(ඇ) වගන්තිය ප්‍රකාරව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සමඟ වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මක් පිලියෙල කර ක්‍රියාත්මක කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂයට අදාළව භාණ්ඩ, සේවා සහ විවිධ ව්‍යාපෘති ඉටුකිරීම වෙනුවෙන් රු. මිලියන 49.28 කට සභාව විසින් සැලැසුම් සකස් කර තිබුණද සමාලෝචිත වර්ෂය තුල සභාවේ අරමුණුවලට අදාළ කිසිදු කාර්යයක් සිදුනොකිරීම හේතුවෙන් ප්‍රසම්පාදන සැලැස්මේ කිසිදු කාර්යයක් 2020 දෙසැම්බර් 31 දින වන විටත් ඉටුකර නොතිබුණි.

(උ) 2020 වර්ෂය සඳහා වූ ක්‍රියාකාරී සැලැස්මේ මාර්ග ආරක්ෂාව කළමනාකරණය කිරීමේ ධාරිතාවය වර්ධනය කිරීම සඳහා ව්‍යාපෘති හා වැඩසටහන් 20 ක් හා එය ඉටුකිරීම සඳහා ක්‍රියාකාරකම් 49 ක් දක්වා තිබූ අතර ඉන් වැඩසටහන් 14 ක් ඉටුකිරීම ආරම්භ කර ඇතත්, එම වැඩසටහන්වල අපේක්ෂිත අරමුණු ඉටු වී නොතිබුණි.

(ඌ) වාර්ෂික අයවැය ඇස්තමේන්තුව අනුව සභාව උපයාගත යුතු ආදායම රු.මිලියන 70 ක් වූ අතර, සභාවේ පුනරාවර්තන වියදම් සඳහා රු. මිලියන 13.79 ක්ද, ප්‍රාග්ධන වියදම් සඳහා රු. මිලියන 63.2 ක්ද වශයෙන් රු. මිලියන 77 ක් වෙන්කර තිබුණි. සභාව රු. මිලියන 71 ක ආදායමක් උපයාගෙන තිබුණද සභාවේ කාර්යයන් සඳහා ක්ෂයවීම් රු. මිලියන 1.3 ක් ඇතුළුව රු. මිලියන 9.5 ක් පුනරාවර්තන වියදම් සඳහා වැයකර තිබුණි. සභාවේ අරමුණු ඉටුකිරීම සඳහා අරමුදල් යෙදවීම අවම මට්ටමක පැවතුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න,
විගණකාධිපති.

<u>මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව.</u>

නීතිරීති විධිවිධාන යොමුව

(අ) මුදල් රෙගුලාසි i

හානි පිළිබඳ ලේඛනය සකස් කර ඇත.

Ii මේ වන තෙක් ඇප තැබීම ජාතික සභා නිළධාරීන් විසින් සිදු කර නොමැති අතර ඉදිරියේදී අමාත්‍යාංශයෙන් උපදෙස් ලබා ගෙන ඇප තැබීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරන බවත් මීට අදාළ ලේඛනය නඩත්තු කිරීමට කටයුතු කරන බවත් සඳහන් කරමි.

(ආ) චක්‍රෙල්ක අංක 842 සහ මුදල් රෙගුලාසි 502

ස්ථාවර වත්කම් ලේඛනය සකස් කර ඇත.

(ඇ)1971 අංක 38 දරන මුදල් පනතේ 11 වන වගන්තිය සහ අංක සහ 2003 ජුනි 02 දිනැති රාජ්‍ය මුදල් චක්‍රෙල්ඛයේ 5.2.4 වගන්තිය.

මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ වර්තමාන සභාපති ලෙස මා වැඩභාර ගනු ලැබුවේ 2020.02.06 දින වන අතර සභාපති ධූරයට පත් වීමෙන් පසු පැවැත්වූ පළමු සභා රැස්වීමේදී සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැය ඇස්තමේන්තුව සඳහා අනුමැතිය ලබා ගන්නා ලදි.

(ඈ) අංක /12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රෙල්ඛයේ
(I)4.2.2 ඡේදය

පැවති කොරෝනා වසංගත තත්වය හේතුවෙන් සමාලෝචිත වර්ෂයට අදාළව පාලක මණ්ඩල රැස්වීම් පැවැත්වීමට නොහැකි වූ අතර පැවැත්වූ රැස්වීම් සඳහා සියලු සාමාජිකයන් සහභාගි කරවා ගැනීමට නොහැකි විය. කෙසේ නමුත් රැස්වීම් සඳහා සහභාගීවීම සම්බන්ධයෙන් විගණන විමසුමට ලක්ව ඇති බැවින්,ඉදිරියේ පැවැත්වෙන රැස්වීම් සඳහා සියලුම සාමාජිකයන් අනිවාර්යයෙන් සහභාගී වියයුතු බවට දැනුවත් කිරීමට අදාල කටයුතු කරනු ලැබේ.

(II) 8.8 ඡේදය

මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ වර්තමාන සභාපතිවරයා ලෙස වැඩභාර ගනු ලැබුවේ 2020.02.06 දින වන අතර සභාපති ධූරයට පත් වීමෙන් පසු පැවැත්වූ පළමු සභා රැස්වීමේදී සමාලෝචිත වර්ෂය සඳහා වූ බලතල පැවරීම සඳහා අනුමැතිය ලබා ගන්නා ලදි.

2.2.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඇ)

(අ) මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව, ජාතික ප්‍රවාහන සුරක්ෂාව පිළිබඳ කොමිෂන් සභාව ලෙස පත් කිරීමට අදාළව අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අවස්ථා කිහිපයකදී ඉදිරිපත් කරන ලද නමුත් අනුමැතිය හිමි නොවූ අතර 2021.05.04 දින නිර්දේශයන් කිහිපයකට යටත්ව ඒ සඳහා අනුමැතිය හිමි විය. එම ලබා දුන් නිර්දේශ අනුව පෙර පැවති පනත් කෙටුම් පත අමාත්‍යාංශ ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් 2021.06.15 වන දින සංශෝධනය කල අතර, එසේ සංශෝධනය කරන ලද පනත් කෙටුම් පත අමාත්‍යාංශයේ නීති අංශය මගින් නීති කෙටුම්පත් සම්පාදක වෙත යොමු කර ඇත.

(ආ) අංක 1387/4 හා 2005 අප්‍රේල් 04 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මඟින් පවරා තිබූ කාර්යයන් පිළිබඳව විමසීමට ලක් කරන ලද කරුණු

1. රථවාහන ප්‍රමාණය ඒවායේ ලක්ෂණ හා සංයුතිය, මාර්ග අනතුරු හා මාර්ග ආරක්ෂාව පිළිබඳ දේශීය හා ජාත්‍යන්තර සංඛ්‍යා තොරතුරු ඇතුළත් පරිගණක දත්ත ගබඩාවක් පවත්වාගෙන යාම

රථවාහන ප්‍රමාණය, ඒවායේ ලක්ෂණ හා සංයුතිය පිළිබඳව තොරතුරු මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් දෙපාර්තමේන්තුවෙන් ලබාගෙන මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව විසින් සකස් කරන ලද විද්‍යුත් පුස්තකාලය හරහා එම තොරතුරු වෙත සම්බන්ධ වීමට හැකිවන පරිදි කටයුතු සකස් කරමින් පවතී.
ශ්‍රී ලංකා පොලිසිය, ලෝක සෞඛ්‍ය සංවිධානය සහ මොරටුව විශ්ව විද්‍යාලය සමඟ එක්ව මේ වන විට බස්නාහිර සහ මධ්‍යම පළාත් තුළ පවත්වාගෙන යන ශ්‍රී ලංකා අනතුරු දත්ත කළමනාකරණ පද්ධතිය, දිවයිනම ආවරණය වන පරිදි ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය යෝජනාවලිය සකස් කර අමාත්‍යාංශ ලේකම්තුමා මඟින් ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇති අතර එය ක්‍රියාත්මක කිරීම සඳහා 2021.08.16 දින අනුමැතිය ලැබුණි. ඒ අනුව ශ්‍රී ලංකා අනතුරු දත්ත කළමනාකරණ පද්ධතිය ස්ථාපිත කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.

2. මාර්ග ආරක්ෂාව විෂය පිළිබඳ පුස්තකාලයක් පවත්වාගෙන යාම

මාර්ග ආරක්ෂාව විෂය පිළිබඳව ස්ථාපිත කිරීමට නිර්දේශ කර ඇති පුස්තකාලය විද්‍යුත් පුස්තකාලයක් ලෙස ස්ථාපිත කිරීමට අදාළ කටයුතු මේ වන විට අවසන් අදියරේ පවතී.

3. සම්බන්ධිත විෂයන් පිළිබඳ පර්යේෂණවලට ආධාර කිරීම

මාර්ග රිය අනතුරු අවම කිරීම මූලික කර ගනිමින් පර්යේෂණ 03ක් සිදු කිරීමට අපේක්ෂිත අතර එහි පළමු පර්යේෂණය ලෙස යතුරුපැදි අනතුරු අවම කිරීම සඳහා වන පර්යේෂණයේ ප්‍රසම්පාදන කාර්යය සිදු කරමින් පවතී. එහි දෙවන පර්යේෂණය ලෙස රිය අනතුරු බහුලව සිදුවන හා පදිකයන් මිය යෑම අවම කිරීමට අදාළ පර්යේෂණය සඳහා ජාතික සභාවේ අනුමැතිය ලැබී ඇත.

4. සමාන ජාත්‍යන්තර ආයතන සමඟ සබඳතා පැවැත්වීම, දැනුම හුවමාරු කර ගැනීම

එක්සත් ජාතීන්ගේ සංවිධානය මඟින් නම් කරන ලද 2011-2020 මාර්ග ආරක්ෂණ දශකය සමාලෝචනය කොට 2030 වර්ෂය වන විට මාර්ග අනතුරු 50%කින් අඩු කිරීමට කළ යුතු කාර්යයන් හඳුනා ගැනීම සඳහා ලෝක සෞඛ්‍ය සංවිධානයේ ශ්‍රී ලංකා නියෝජිත කාර්යාලයේ නියෝජිතයකු හා ජාතික සභාවේ නියෝජිතයන්ගෙන් යුත් කමිටුවක් පත් කරගෙන ඇති අතර එහි ඉදිරි කටයුතු ආරම්භ කිරීමට නියමිතය.

5. මාර්ග ආරක්ෂාව පිළිබඳ ව්‍යාපෘති සකස් කිරීම හා ක්‍රියාවට නැංවීම

වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මෙහි සඳහන් මාර්ග ආරක්ෂාව පිළිබඳව ව්‍යාපෘති මේ වන විට ක්‍රියාත්මක කරමින් පවතී.

6. රජය හා රාජ්‍ය නොවන සංවිධාන තුළ මාර්ග ආරක්ෂාව හා සම්බන්ධිත කාර්යයන් සම්බන්ධීකරණය කිරීම සහ මාර්ග ආරක්ෂාව හා සම්බන්ධිත ප්‍රතිපත්තීන් සහ ව්‍යාපෘති පිළිබඳ රජයට උපදෙස් ලබා දීම

මාර්ග ආරක්ෂාව හා සම්බන්ධිත කාර්යයන් පිළිබඳව උපදෙස් ලබා දීම සඳහා අදාළ පාර්ශවයන් සමඟ එක්ව සකස් කරන ලද 2021-2026 වර්ෂයන් සඳහා මාර්ග රිය අනතුරු අවම කිරීම සඳහා වන ක්‍රියාකාරී සැලැස්ම මේ වන විට මුද්‍රණය කරමින් පවතී.
එමෙන්ම, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ නියෝගයක් ලෙස මාර්ග ආරක්ෂාව හා ප්‍රවාහනය සම්බන්ධ ගැටළු විසඳීම සඳහා සම්බන්ධීකරණ කමිටුවක් පත් කිරීමට අදාළව මේ වන විට අමාත්‍යාංශය මඟින් කමිටු සාමාජිකයන් පත් කරමින් පවතී. එම කමිටුවෙන් ලබා දෙන නිර්දේශයන් රජයට ඉදිරිපත් කිරීමට නියමිතය.

2.2.4 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තිය.

පැවති කොරෝනා වසංගත තත්වය හේතුවෙන් වර්ෂයේ ප්‍රසම්පාදන කටයුතු අපේක්ෂිත ආකාරයෙන් සිදු කිරීමට නොහැකි වූ අතර මේ වන විට සභාවේ සම්පත් කාර්යක්ෂම හා ඵලදායී ලෙස ප්‍රසම්පාදනය කර භාවිතා කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරනු ලැබේ.

02. වෙනත් කරුණු

(අ) මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව වෙත 2018 වර්ෂය තුළ ලැබුණු වන්දි අයදුම්පත් සියල්ලම සඳහා මේ වන විට මූල්‍ය සහන ලබා දී අවසන් කර ඇත. 2019 වර්ෂය තුළ ලද අයදුම්පත් අතරින් එක් අයදුම්පතක් 2021.08.09 දින පැවති ජාතික සභා රැස්වීමේදී ප්‍රතික්ෂේප වූ අතර එක් අයදුම්පතක් සඳහා අනුමැතිය හිමි විය. තවත් එක් අයදුම්පතක් ස්ථාවර කමිටු රැස්වීම වෙත යොමු කිරීමට නියමිතව ඇත.
(ආ) මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව මගින් ක්‍රියාත්මක කරනු ලබන හදුනා නොගත් වාහන වලින් සිදුවන අනතුරු සඳහා මුල්‍ය සහන ලබා ගැනීම සඳහා වන ඉල්ලීම් සියල්ලම රථවාහන පොලිස් මූලස්ථානය මගින් සිදුකරනු ලබන පරීක්ෂණ ක්‍රියාවලියකින් හා මාර්ග ආරක්ෂාව ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව මගින් ස්ථාපිත කර ඇති තිදෙනෙකුගෙන් යුක්ත ස්ථාවර කමිටුව මගින් ලබාදෙන නිරීක්ෂණයන්ගෙන් පසු මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභා රැස්වීමට ඉදිරිපත් කර අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරුව මූල්‍ය සහන ලබාදීම සිදු කරනු ලැබේ.

උක්ත ක්‍රියාවලිය සඳහා යම් සැලකිය යුතු කාලයක් ගත වන අතර, ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව වෙත ඉදිරිපත් වන සමහර ඉල්ලීම් සම්බන්ධයෙන් අවශ්‍ය තොරතුරු සමහර ඉල්ලුම්කරුවන් විසින් ඉදිරිපත් නොකරන අවස්ථාවන් වලදී , නැවත දැන්වීමෙන් අනතුරුව එම තොරතුරු ගෙන්වා ගැනීමට සිදුවේ. එසේ වුවත්, එවැනි අඩුපාඩු සහිත ඉල්ලීම් වලට අදාළ තොරතුරු ගෙන්වා ගැනීම සඳහා සමහර අවස්ථාවන් වලදී සිහිකැඳවීම් කිහිපයක් වුව ද යොමු කිරීමට සිදුවේ.
මූල්‍ය සහන ලබාදීමේ ක්‍රියාවලිය තුළ, ඉල්ලීම් ඉදිරිපත් වූ අවස්ථාවේ සිට මූල්‍ය සහන ලබාදීමේ අවස්ථාව දක්වා සිදුවන යම් යම් ප්‍රමාදයන් අවම කිරීම සඳහා මේ වනවිටත් කටයුතු සිදුකරමින් පවතින බව දන්වන අතර, ප්‍රමාදයකින් තොරව මූල්‍ය සහන ලබාදීමේ ක්‍රියාවලිය සිදුකිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බව දන්වමි. මෙම කරුණ සම්බන්ධයෙන් 2021.08.06 දින පැවති ජාතික සභා රැස්වීමේදී දීර්ඝව සාකච්ඡා කරන ලද අතර එහිදී රිය අනතුර සිදුවී මාස 6කට පසුවත් අනතුර සිදු කල වාහනය හදුනාගෙන නොමැති නම් වන්දි මුදල් ලබා දීමට තීරණය කළ අතර වන්දි මුදල් ගෙවූ පසු අනතුර සම්බන්ධයෙන් නඩු විභාගයක් පැවතියහොත් විත්දිත පාර්ශවයට මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව විසින් වන්දි මුදල් ගෙවා ඇති බව සහ ගෙවූ මුදල ගරු අධිකරණයට දැනුම් දෙන ලෙස අදාළ රථ වාහන පොලිසිය දැනුවත් කරන ලෙසත් තීරණය කර ඇත.

(ඇ) හප්පා පලාගිය අනතුරු සම්බන්ධයෙන් සමාජය දැනුවත් කිරීම සඳහා සියලු පොලිස් ස්ථානයන් ආවරණය වන පරිදි දැනුවත් කිරීමේ අත්පත්‍රිකා හා එක්ස්-පුවරු සකස් කර සියලුම පොලිස් ස්ථාන වලට බෙදාහැරීමේ කටයුතු සිදු කර ඇති අතර සියලුම දිස්ත්‍රික් ලේකම් කාර්යාල සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලද ආවරණය වන පරිදි දැනුවත් කිරීමේ අත්පත්‍රිකා හා එක්ස්-පුවරු එම ස්ථාන වල ස්ථාපිත කිරීමට අදාළ කටයුතු ආරම්භ කර ඇත. එමෙන්ම ප්‍රසිද්ධ රූපවාහිනී මාධ්‍ය හරහා Easy TV ප්‍රචාරණ ක්‍රමයක් ඔස්සේ වන්දි ලබා දීමේ ක්‍රමවේදය පිළිබඳව දැනුවත් කිරීමේ කටයුතු ආරම්භ කර ඇත. ඒ අනුව මේ වන විට වන්දි ඉල්ලුම්පත් ආයතනය වෙත ලැබීමේ පැහැදිලි වර්ධනයක් පෙන්නුම් කරයි.

(ඈ) මේ වන විට ප්‍රවාහන අමාත්‍යාංශය මගින් අනුයුක්ත කර ඇති සංවර්ධන නිළධාරීන් තිදෙනෙක්, අභ්‍යාසලාභී උපාධිධාරී(පුහුණු) සිව් දෙනෙක්,කළමනාකරණ සේවා නිලධාරියෙක්, කාර්යාල කාර්ය සහයකයෙක්, රියදුරෙක්, ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය මගින් අනුයුක්ත කර ඇති ලිපිකරුවෙත්, දුම්රිය දෙපාර්තමේන්තුව මගින් අනුයුක්ත කර ඇති තාක්ෂණ ශිල්පී සහයක දෙදෙනෙක්,කාර්යාල කාර්ය සහයකයෙක් සහ දුම්රිය කාර්ය සහයකයෙක් විසින් වැඩකටයුතු සිදු කරන අතර කාර්ය මණ්ඩලයක් අනුමත කරවා ගැනීම සම්බන්ධයෙන් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් ඉදිරිපත් කර ඇති නිර්දේශ වලට අදාළ වාර්තාව සකස් කරමින් පවතී.

(ඉ) 2021.03.31 දින පැවති ජාතික සභා රැස්වීමේදී සභා සාමාජිකයන්ගේ තීරණය වූයේ අමාත්‍යාංශ ලේකම්තුමාගේ අනුමැතියෙන් අදාළ උපකරණ වඩාත් ඵලදායී ලෙස ප්‍රයෝජනයට ගත හැකි ආයතනයක් වෙත ලබාදීම සුදුසු බවයි. අමාත්‍යාංශ ලේකම්තුමන් වෙත මෙම තත්වය පිළිබඳ පැහැදිලි කර ඒ අනුව අතිරේක ලේකම් (පාලන) සහ අතිරේක ලේකම් (තාක්ෂණ) විසින් අදාළ උපකරණ සහිත ස්ථානය නිරීක්ෂණය කරන ලදි. එහිදී එම පරිශ්‍රය රාජ්‍ය අමාත්‍යාංශයෙන් නැවත වෙන් කර ක්‍රියාත්මක කරගෙන යාම සඳහා උපදෙස් දුන් නමුත් රාජ්‍ය අමාත්‍යාංශයෙන් එය ලබා ගැනීම සඳහා කරන ලද ඉල්ලීම් ප්‍රතික්ෂේප විය. ඒ අනුව අදාළ උපකරණ වෙනත් ස්ථානයක ස්ථාපිත කිරීම සඳහා කටයුතු කරන මෙන් රාජ්‍ය අමාත්‍යාංශය මගින් උපදෙස් ලබා දී ඇත.

(ඊ) 2020 වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්ම 2020.02.08 දින මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව විසින් අනුමත කල අතර 2020.03.11 දින අමාත්‍යාංශ ලේකම්තුමාගේ අනුමැතියට යොමු කරන ලදි. ඒ සඳහා 2020.06.11 දින අනුමැතිය ලද අතර 2021.06.02 දින ලංසු විවෘත කිරීමේ කමිටුව හා තාක්ෂණික ඇගයීම් කමිටුව සඳහා අනුමැතිය හිමි විය. මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව සඳහා ප්‍රසම්පාදන කමිටුව ස්ථාපිත කිරීම සම්බන්ධයෙන් 2020.09.03 දින ජාතික ප්‍රසම්පාදන කොමිසම වෙත ලිපියක් යොමු කිරීමෙන් පසු 2020.09.10 දින එය අනුමත විය. 2020.10.05 ප්‍රසම්පාදන කමිටුව පත් කිරීමට අදාළ ලිපිය අමාත්‍යාංශ ලේකම්තුමා වෙත යොමු කළ අතර 2020.10.13 දින එය අනුමත විය. එමෙන්ම කොරෝනා තත්වය හේතුවෙන් අවස්ථා කිහිපයකදී දිවයිනෙහි ඇදිරි නීතිය ක්‍රියාත්මක විය. මෙම තත්වයන් හේතුවෙන් අපේක්ෂිත ආකාරයට ප්‍රසම්පාදන කටයුතු සංවිධානය නොවූ අතර මේ වන විට අදාළ කටයුතු විධිමත් ලෙස සිදු කරමින් පවතී.

(උ) කොරෝනා වසංගත තත්වය හේතුවෙන් අදාළ වැඩසටහන් අපේක්ෂිත පරිදි සිදු කර ගෙන යාමට අපොහොසත් වූ නමුත් මේ වන විට එම වැඩසටහන් ආරම්භ කර ක්‍රියාත්මක කරමින් පවතී. එම එක් එක් වැඩසටහනෙහි වර්තමාන තත්වය පිළිබඳව විගණනයට පිළිතුරු ලබා දී ඇත.

(ඌ) කොරෝනා වසංගත තත්වය හේතුවෙන් අයවැයගත ප්‍රාග්ධන හා පුනරාවර්තන වියදම් අපේක්ෂිත ආකාරයට වැය කිරීමට නොහැකි වූ අතර අරමුදල් යෙදවීම අවම මට්ටමක පැවතුණි. ඉදිරියේදී අරමුදල් අයවැය ඇස්තමේන්තුවට අනුව යෙදවීමට අවශ්‍ය කටයුතු සිදු කරන බව දන්වා සිටිමි.

ආර්.එල්.ඇන්ටන් ද මෙන්ස්.
සභාපති,